# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.07 31 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 05/2019**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම</u>**

දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ බලතල විමධ්‍යගත කිරීම සඳහා 2019.06.24 දින පවත්වන ලද සාකච්ඡාව අනුව සකස් කළ කමිටු වාර්තාවේ සඳහන් කරුණු පිලිබඳ පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට කමිටුව විසින් තීරණය කළ අතර එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.07.19 දින ලබාදී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/3/19 හා 2019.07.25 දිනැති ලිපියෙන් දන්වා එවා ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

1. **මූල්‍ය වටිනාකම රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සකස් කිරීමේ බලතල පැවරීම.**

   <u>කොන්දේසි</u>

   1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ තාක්ෂණ නිලධාරීන් සකස් කරන ඇස්තමේන්තු (දිස්ත්‍රික් කාර්යාල වල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල/පළාත් පාලන ආයතන වල සිටින II ශ්‍රේණියේ තාක්ෂණික නිලධාරීන් මෙයට අදාල වේ.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II A, හෝ I පන්තියේ නිලධාරියෙකු විසින් නිර්දේශ කළයුතු අතර, ඒ සඳහා වන අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දිය යුතුය.

   1.2 රුපියල් ලක්ෂ 20 දක්වා සීමාව තුල ඉදිකරන කර්මාන්ත සඳහා ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළැඹීමේ බලතල ඉහත 1.1 පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office } 091 2234052 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefse~1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

1.3 රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සඳහා වුව ද විශේෂිත ඉංජිනේරුමය, ව්‍යුහාත්මක සැලසුම් (Structural Drawing) ඇතුලත්ව ඇති විට තාක්ෂණ නිලධාරීන් විසින් අදාල ඇස්තමේන්තු පිලියෙල කිරීම නොකළ යුතු අතර, ඒ සඳහා අදාල ඉංජිනේරුවරුන්ගේ උපදෙස් ලබාගෙන අදාල කටයුතු ඉටු කළ යුතුය.

(ගොඩනැගිලි, වාරිමාර්ග, මහාමාර්ග සඳහා අදාල වේ).

2. වර්ෂය තුල අනුමත මිල ගණන් භාවිතයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3. වාර්ෂික මිල ගණන් සකස් කිරීම සෑම වසරකට දෙවරක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන අතර එසේ, අනුමත වු මිල ගණන් සෑම ආයතනයක්ම ඉදිකිරීම් සඳහා යොදාගත යුතුය.

4. රු.ලක්ෂ 20 ඉක්මවන ඇස්තමේන්තු දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල / පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව / පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් කර්මාන්තවල නම්, ඒ ඒ ආයතනවල සිටින ඉංජිනේරුවරුන්ට යොමු කර ඇස්තමේන්තු සකස් කළ යුතුය.

5. අමතර වැඩ සඳහා යොදා ගැනෙන මිල විශ්ලේෂණ, විශේෂිත මිල ගණන් අනුමත කිරීමේ බලතල මිල ගණන් සකස් කරන ආයතනයටම යොමු කර අනුමැතිය ලබා ගැනීම කළ යුතුය.

6. **රුඳවුම් මුදල් නිදහස් කිරීම**

රු.ලක්ෂ 10 ත් 20 ත් අතර රුඳවුම් මුදල් නිදහස් කිරීම හා අවසන් ගෙවීම් වලදී සෑම විටම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ නිලධාරියෙකුගේ නිර්දේශය මත විය යුතු වන අතර, විශේෂ ගැටළු සහිත අවස්ථාවකදී පමණක් ඉංජිනේරු සහය ලබාගත යුතුය.

7. **ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබන කර්මාන්ත**

ඉංජිනේරුවන් විසින් ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ මූල්‍ය සීමාවන් පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීම සුදුසු වන අතර, එක් එක් ආයතන වල ඉංජිනේරුවන්ගේ අනුමත කිරීමේ මූල්‍ය සීමාවන් ඉක්මවා යන විට ඉහල වටිනාකමින් යුත් ඇස්තමේන්තු අනුමැතිය ලබා ගැනීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත යොමු කළ යුතුය.

8. **ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල.**

| ඉංජිනේරු සේවා කාර්යාලය / පළාත් පාලන දෙපාර්තමේන්තු | ඇස්තමේන්තු අනුමත කිරීම (රු.මිලියන) | ගිවිසුම්වලට එළඹීමේ බලය (රු.මිලියන) |
|---|---|---|
| 1.ප්‍රධාන ලේකම් | - | 500 ට වැඩි |
| 2.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | 30 ට වැඩි | 500 දක්වා |
| 3.ගොඩනැගිලි අධ්‍යක්ෂ | 30 දක්වා | - |
| 4.ප්‍රධාන ඉංජිනේරු(වෙනත්ගොඩනැගිලි/පාසල්ගොඩනැගිලි) | 20 දක්වා | - |
| 5.දිස්ත්‍රික් ඉංජිනේරු | 10 දක්වා | - |
| 6.ප්‍රාදේශීය ඉංජිනේරු | 05 දක්වා | - |

9. ඇස්තමේන්තු නියමිත පරිදි අනුමත කළ පසුව එම ඇස්තමේන්තු පදනම් කර ගෙන ගිවිසුම්ගත වීම ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හා අධීක්ෂණයට, සියලු කොන්ත්‍රාත් පරිපාලනමය කටයුතු ඉටුකරගෙන යාමට ඉංජිනේරුවන් සඳහා ඉහත මූල්‍ය සීමාවන් තවදුරටත් බාධාවක් නොවිය යුතුය.

මීට පෙර නිකුත් කරන ලද, ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම් වලට එළඹීමේ බලතල පිළිබඳ නිකුත් කළ ඉහත සීමාවන් ඇතුලත් වූ සියලු චක්‍රලේඛයන් මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ අවලංගු වේ.

මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව / ආයතනය යටතේ පවතින ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම් ,
දකුණු පළාත.

පිටපත් - 01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - දැ.ගැ.ස
03. සහකාර ප්‍රධාන ලේකම් (පාලන/ආයතන/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස
05. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
06. අයවැය අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"


# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
ஆளுநர் செயலகம்
GOVERNOR'S SECRETARIAT

දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.


මගේ අංකය / எனது இல / My No. G/SP/1/2/1/3/19

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date 2019.07.25

31 JUL 2019

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම් වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/7/3/7 හා 2019.07.10 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඇස්තමේන්තු සකස් කිරීමේ/ගිවිසුම් වලට එළඹීමේ සීමාවන් පිළිබඳ පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.07.19 වන දින ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

1. මූල්‍ය වටිනාකම රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සකස් කිරීමේ බලතල පැවරීම
   **කොන්දේසි:**

1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ තාක්ෂණ නිලධාරීන් සකස් කරන ඇස්තමේන්තු (දිස්ත්‍රික් කාර්යාල වල/ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වල /පළාත් පාලන ආයතන වල සිටින II ශ්‍රේණියේ තාක්ෂණික නිලධාරීන් මෙයට අදාළ වේ.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II A, හෝ I පන්තියේ නිලධාරියෙකු විසින් නිර්දේශ කළයුතු අතර, ඒ සඳහා වන අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රධානියා / අමාත්‍යංශ ලේකම් විසින් ලබා දිය යුතුය.

1.2 රුපියල් ලක්ෂ 20 දක්වා සීමාව තුල ඉදිකරන කර්මාන්ත සඳහා ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල ඉහත 1.1 පරිදි ක්‍රියාත්මක කළ යුතුය

1.3 රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සඳහා වුව ද විශේෂිත ඉංජිනේරුමය, ව්‍යුහාත්මක සැලසුම් (Structural Drawing) ඇතුලත්ව ඇති විට තාක්ෂණ නිලධාරීන් විසින් අදාල ඇස්තමේන්තු පිළියෙල කිරීම නොකළ යුතු අතර, ඒ සඳහා අදාල ඉංජිනේරුවරුන්ගේ උපදෙස් ලබාගෙන අදාල කටයුතු ඉටු කළ යුතුය.
(ගොඩනැගිලි,වාරිමාර්ග,මහාමාර්ග සඳහා අදාලවේ)

2. වර්ෂය තුල අනුමත මිල ගණන් භාවිතයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3. වාර්ෂික මිල ගණන් සකස් කිරීම සෑම වසරකට දෙවරක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන අතර එසේ, අනුමත වු මිල ගණන් සෑම ආයතනයක්ම ඉදිකිරීම් සඳහා යොදාගත යුතුය.

4. රු.ලක්ෂ 20 ඉක්මවන ඇස්තමේන්තු දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල/පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව/පළාත් පාලන දෙපාර්තමේන්තුව වලට අයත් කර්මාන්ත වල නම්, ඒ ඒ ආයතනවල සිටින ඉංජිනේරුවරුන්ට යොමු කර ඇස්තමේන්තු සකස් කළ යුතුය.


ආණ්ඩුකාර ලේකම්/ Governor's Secretary -Tp/Fax 091 2222498
සහකාර ලේකම්/ Assistant Secretary -Tp 091 2226990
නීති නිලධාරී/ Legal Officer -Tp 091 3097160
පරිපාලන නිලධාරී/Administrative Officer -Tp/Fax 091 2234480
විද්‍යුත් තැපෑල/ E-mail - governsecspc@sltnet.lk
වෙබ් අඩවිය/ Web site - governer.sp.gov.lk

5. අමතර වැඩ සඳහා යොදා ගැනෙන මිල විශ්ලේෂණ, විශේෂිත මිල ගණන් අනුමත කිරීමේ බලතල මිල ගණන් සකස් කරන ආයතනයටම යොමු කර අනුමැතිය ලබා ගැනීම කළ යුතුය.

6. රැඳවුම් මුදල් නිදහස් කිරීම:
රු. ලක්ෂ 10 ත් 20 ත් අතර රැඳවුම් මුදල් නිදහස් කිරීම හා අවසන් ගෙවීම් වලදී සැම විටම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ නිලධාරියෙකුගේ නිර්දේශය මත අදාල කටයුතු විය යුතු වන අතර, විශේෂ ගැටළු සහිත අවස්ථාවකදී පමණක් ඉංජිනේරු සහය ලබා ගත යුතුය.

7. ඉංජිනේරුවන්ගේ අධික්ෂණය යටතේ ඉටුකරනු ලබන කර්මාන්ත:
ඉංජිනේරුවන් විසින් ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ මුලා සීමාවන් පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීම සුදුසු වන අතර, එක් එක් ආයතන වල ඉංජිනේරුවන්ගේ අනුමත කිරීමේ මුලා සීමාවන් ඉක්මවා යන විට ඉහල වටිනාකමින් යුත් ඇස්තමේන්තු අනුමැතිය ලබා ගැනීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත යොමු කල යුතුය.

8. ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල:

| ඉංජිනේරු සේවා කාර්යාලය/පළාත් පාලන දෙපාර්තමේන්තු | ඇස්තමේන්තු අනුමත කිරීම (රු. මිලියන) | ගිවිසුම් වලට එළඹීමේ බලය (රු.මිලියන) |
|---|---|---|
| 1.ප්‍රධාන ලේකම් | - | 500 ට වැඩි |
| 2.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | 30 ට වැඩි | 500 දක්වා |
| 3.ගොඩනැගිලි අධ්‍යක්ෂ | 30 දක්වා | - |
| 4.ප්‍රධාන ඉංජිනේරු (වෙනත් ගොඩනැගිලි/පාසල් ගොඩනැගිලි) | 20 දක්වා | - |
| 5.දිස්ත්‍රික් ඉංජිනේරු | 10 දක්වා | - |
| 6.ප්‍රාදේශීය ඉංජිනේරු | 05 දක්වා | - |

9. ඇස්තමේන්තු නියමිත පරිදි අනුමත කළ පසුව එම ඇස්තමේන්තු පදනම් කර ගෙන ගිවිසුම්ගත වීම ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හා අධීක්ෂණයට, සියලු කොන්ත්‍රාත් පරිපාලනමය කටයුතු ඉටුකරගෙන යාමට ඉංජිනේරුවන් සඳහා ඉහත මුලා සීමාවන් තවදුරටත් බාධාවක් නොවිය යුතුය.

මීට පෙර නිකුත් කරන ලද ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම් වලට එළඹීමේ බලතල පිළිබඳ නිකුත් කළ ඉහත සීමාවන් ඇතුලත් වූ සියලු චක්‍රලේඛයන් 2019.07.19 දින මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ අවලංගු වේ.

ඒ.යූ.වෙලාරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

ඒ.යූ.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම් - දකුණු පළාත
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
පහළ ඩික්සන් පාර, ගාල්ල

පිටපත: නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු සේවා), දකුණු පළාත - කා.දැ.ගැ.ස.